හරි ටීචර් ළමයි ගොඩාක් සතුටින් කිව්වා.

අපි එහෙනම් අද ගාලු කොටුව ගැන ඉගෙන ගනිමු.

පරිසර චාරිකාව යන දවසේ උදේම ළමයි හැමෝම දුම්රිය ස්ථානයට ආවා.

හරි නේද පුතාලා හැමෝම ආවනේ එහෙනම් පොරකන්නෙ නැතිව පරිස්සමට කෝච්චියට නැග ගන්න. හැමෝම ළමයි මග ඇරෙන්නෙ නැතිවෙන්න ළඟින් ළඟින් වාඩි වෙන්න.



චාරිකාව අතරමගදී ගුරුතුමිය අවට දර්ශන ගැන ළමයින්ව දැනුවත් කරා.

අද මේ යන්නේ පරිසර චාරිකාවක් නිසා හොඳ විමසිල්ලෙන් යන්න පුතාලා, ඔයාලට ගොඩාක් වැදගත් වෙන දේවල් බලාගන්න පුළුවන්.



ටීචර් දැන් මේ මොන පැත්තද..?

දැන්නම් පුතේ මේ අම්බලන්ගොඩ. මෙහේ තමයි රූකඩ වෙස්මූණු වලට ප්‍රසිද්ධ පැත්ත.





අර වතුර මැද තියෙන බුදු පිළිමය බලන්න... ලස්සන හිටි පිළිමයක් නේද ටීචර්..?

මොකද්ද ඒකේ වැදගත්කම...?



